රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක: 14.

මගේ අංක: 946එල්/47වී.
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7.
1974 ජනවාරි මස 24 වැනි දින.

සියලුම ලේකම්වරු සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## සැතපුම් කුලී ප්‍රමාණයන්--මෝටර් රථ සහ මෝටර් සයිකල.

සිය පුද්ගලික මෝටර් රථ සහ මෝටර් සයිකල නිල චාරිකා සඳහා යොදා ගැනීමේදී රාජ්‍ය නිලධාරීන් සඳහා ගෙවීමට නියමිත සැතපුම් කුලී ප්‍රමාණයන් දැක්වෙන, ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 8:2 සහ 9:1 වගන්ති කෙරේ අවධානය යොමු කරනු මැනවි.

2. මෑතදී පැට්‍රෝල් මිල නැගීම් ගැන සලකා, ඒ පිළිබඳ අතුරු පියවරක් වශයෙන් පහත දැක්වෙන සැතපුම් කුලී ප්‍රමාණයන් ගෙවීමට තීරණය කර ඇත.

8:2 වගන්තිය.

| මෝටර් රථයේ බර | සැතපුමකට මුදල |
|---|---|
| හෝ: 17 ට වැඩි | රු: 1.00 |
| හෝ: 14 ට වැඩි නමුත් හෝ:17 ට නො වැඩි | .85 |
| හෝ: 14 සහ ඊට අඩු | .70 |

9:1 වගන්තිය.

| | |
|---|---|
| මෝටර් සයිකල | .28 |

3. මෝටර් රථ සඳහා සැතපුම් කුලී ලැබීමට සාමාන්‍යයෙන් හිමිකම් ඇත්තාවූ රාජ්‍ය නිලධාරීන්හට උපරිමය සැතපුමකට =/60ක් වනසේද,, සාමාන්‍යයෙන් සැතපුම් කුලිය ලැබීමට හිමිකම් නොමැති නමුත් මෝටර් රථ තබා ගැනීම නියමකොට ඇත්තාවූ නිලධාරීන්ට සැතපුමකට =/50ක් වනසේද, පරිවර්තිත ගමන් වියදම් දීමනා නියම කර ඇති, 69.12.14 දිනැති අංක එල් 50 දරණ(භාණ්ඩාගාර අංක 422එල්/28වී) භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය කෙරේද අවධානය යොමු කරනු මැනවි. මෙකී ප්‍රමාණයන් පිළිවෙලින් සැතපුමකට ශත=/85 සහ ශත=/70 වන සේ දැන් සංශෝධනය කෙරේ.

4. මෙම ප්‍රතිශෝධිත කුලී ප්‍රමාණයන් 1974 ජනවාරි 9 වැනිදා සිට බලපැවැත්වේ.

5. මෙම චක්‍රලේඛයේ අන්තර්ගත කරුණු, ඔබගේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සියලුම රජයේ සේවකයන් හට දැනගැනීමට සැලසුව මැනවි.

ඩී. සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

සී/24-